[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 6 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II | පැය - 2 යි. |

නම ..........................................................................................

සැලකිය යුතුයි;

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

## i පත්‍රය

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පංච මහා විලෝකනය හඳුන්වන තවත් නමකි,
   i. පංච සීලය. ii. පස්මහ බැලුම්. iii. පංචතූර්ය භාණ්ඩ iv. පංච නීවරණ

2) "අග්ගෝ හමස්මි ලෝකස්ස..." යන ගාථාව,
   i. සිදුහත් කුමරු විසින් පවසන ලදී.
   ii. බුදුරජාණන් වහන්සේ විසින් පවසන ලදී.
   iii. බෝධි සත්වයන් වහන්සේ විසින් පවසන ලදී.
   iv. කිසා ගෝතමිය විසින් පවසන ලදී.

3) වප් මගුල් දින සිදුහත් කුමරු විසින් වඩන ලද භාවනාව නම්,
   i. බුදු ගුණ භාවනාව යි.
   ii. සක්මන් භාවනාව යි.
   iii. මෛත්‍රී භාවනාව යි.
   iv. ආනාපාන සති භාවනාව යි.

4) සිදුහත් කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව පවසන ලද්දේ කවුරුන් විසින්ද?
   i. සුද්ධෝදන රජතුමා විසිනි.
   ii. සර්වමිත්‍ර බමුණු පඬිතුමා විසිනි.
   iii. කොණ්ඩඤ්ඤ බමුණා විසිනි.
   iv. බමුණන් 108 දෙනකු විසිනි.

5) නිබ්බුත පද පවසන ලද්දේ,
   i. පටාචාරාව විසිනි.
   ii. කිසා ගෝතමිය විසිනි.
   iii. මහා ප්‍රජාපතී ගෝතමිය විසිනි.
   iv. චිංචි මානවිකාව විසිනි.



LIVEWORKSHEETS

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

6) සිදුහත් කුමරු ගිහිගෙය කළකිරුණේ ........................................................................................ දැකීමෙනි.
(සතර සංග්‍රහ වස්තු/ සතර පෙර නිමිති/ සතර ඍද්ධිපාද)

7) සිදුහත් කුමරු ගිහිගෙයින් නික්ම යාම සඳහා වූ විශේෂ නාමය ..........................................................ලෙස හඳුන්වයි.
(මහාභිනිෂ්ක්‍රමණය/ සත්‍ය ගවේෂණය/දුෂ්කර ක්‍රියාව)

8) කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන තාපසවරුන්ව හඳුන්වන ලද්දේ.............................
....................................ලෙසිනි.
(භද්දවග්ගිය කුමාරවරුන්/ පස් වග තවුසන් / තුන්බෑ ජටිල පිරිස)

9) සිදුහත් බෝසතාණන් වහන්සේට කිරිපිඩු පූජා කරන්න ලද්දේ.................................................... විසිනි.
(සුජාතා සිටු කුමරිය /මහා ප්‍රජාපතී ගෝතමිය / විශාකා සිටු කුමරිය)

10) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වන විට වයස අවුරුදු ............................................කි.
(30 / 33 / 35 )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ" කොටසට ගැලපෙන අංකය තෝරා "ආ" කොටසෙහි ඇති තිත් ඉර මත ලියන්න.**

| "අ" කොටස | "ආ" කොටස |
|---|---|
| 11) ඉතිපිසෝ භගවා අරහං යනු | (.........) 1. මෛත්‍රිය භාවනාව වඩන ආකාරය යි. |
| 12) මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා...! | (.........) 2. කම්මැලි නැති බවයි. |
| 13) මේ වැලි දෝතේ වැලිකැට ගණනට මට ආශීර්වාද ලැබේවා... | (.........) 3. බුදුගුණ පාඨයයි. |
| 14) අලීනතාවය යනු | (.........) 4. සීලයයි. |
| 15) කය, වචනය සංවර කර ගැනීම. | (.........) 5. රාහුල හිමිගේ ප්‍රකාශයකි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ කියවා බලා හරි නම් හරි ( √ ) ලකුණ ද, වැරදි නම් වැරදි (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනු බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදයයි. (   )
17) මෙත්තා,කරුණා, මුදිතා, උපේක්ඛා යනු සිව් බඹ විහරණය. (   )
18) මඝ කුමාරයා ඇතුළු පිරිසට ඇතා ළං නොවූයේ ඔවුන් ළඟ මන්ත්‍රයක් තිබූ නිසාවෙනි. (   )
19) ජාතික ගීයේ නිර්මාණවරයා වන්නේ ආනන්ද සමරකෝන් මහතා ය. (   )
20) ආනන්ද සර්පයා දුටුවාද? මෙම ප්‍රකාශය කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. (   )



LIVEWORKSHEETS